Page 8 April 2013.qxd 15/05/2013 12:01 Page 1



# නිර්මාණ Nirmana

## ලංකා විත්ති යුවතියට සොළොස් විය පිරෙයි !

ප ර දෙස වසන හෙළ වැසියන් වෙත පැමිණ
හැර දොම්නස් සිතින් ලක් මව සිහි කරන
සු ර හන විත්ති ලංකා නිති මන බඳින
පු ර වන ලද සොළොස් අවුරුදු ඇත මෙතැන

බ ස හෙළ අප දිවෙන් අමතක නොම කරන
ර ස බර කවි කතා බිහිවෙයි ඇය මුවින
දෙස විදෙසින් පුවත් රැස්කර හෙළි කරන
ම ස කට වරක් වත් දුටුවිට සිත පිරෙන


සි ත ගනු පිණිස නෙක පැහැ පිළි නැත දැරුවේ
ව ත හැඩි ඇයගෙ හැම දිනකම කළු සුදුවේ
නැත ඇය අනිසි කිසිවෙකුටත් හිස නැමුවේ
අ ත දී බොරුවකින් කෙනෙකුගෙ හිත දිනුවේ

නොලැබුණු විටදි අය දැකුමට පුරුදු ලෙස
ඇ ති වු ණු සිතෙහි සංකා සිහිවේ නිරස
බි හි ව නු නොවන ලෙස ඒ දුක මතු දවස
වැ ජ ඹෙ නු මැනවි නොනැවත ඉර හඳ විලස!

ගත සිත වෙහෙස නොතකා ගොර දුක දැරුව
මත කය බිළිඳු කල සිට ඇය දැඩි කෙරුව
සිත මින දයා රණසිහ ලෙස හෙළ විරුව
පත නෙමු දිගාසිරි! ඔහු හට යුහු සුරුව

♦ ***වෛද්‍ය උපාලි අබේසිරි***
**Middx UK**

## අම්මේ මේ ඔබටයි !



රටාවක් ලෙස ඔබ වියූවත් පන් පැදුර
ලතාවක් නෑ අම්මේ
මේ දුවන කළබල ලෝකේ
දුවගෙන ඇවිත් ඒ සෙනග අතරින්......
මේ අහිංසක මුවැත්තී.....
ආයෙ කවදා තුරුල්වෙන්නද
ඔබේ උණුසුම් තුරුල්ලේ

කලාවැවේ නිල්දිය කැටේ සිහිලස
දැනුණි මට නුඹෙ සිහිල් උකුලේ
හැමදාම හෙට හොඳට සලකමි සිතුවත්
ඉඩ දුන්නෙ නෑ එගෙ චූංචි පසුම්බිය
අනේ මට සමාවෙන්න
රත්තරන් අම්මේ......

වෙනදා වාගේ ගේ කඩුල්ල ළඟ
මා එනතුරු බලා සිටින
ඔබේ දයාබර සෙවනැල්ල
තව බොහෝ කල් යනතුරු මට මැවී පෙනේවි
සමහරවිට මම......මියයන තුරුම.....

♦ ***වසන්තා කුමාරි දසනායක***
**මයිලවලාන කිරිඳිවැල Sri Lanka**

## කන්දක් උසට දුක් වින්දා අප හින්දා

ගමේ පිපුණ ටියුලිප් මල අපෙ අම්මා
ගමේ වැටුණ හිරු එළියලු අපෙ අම්මා
ගමේ හිටපු රූ රැජිණලු අපෙ අම්මා
ගමේ කමට පිටුපෑවලු අපෙ අම්මා

කන්ද උඩරටින් තරුණෙකු ආවා ලූ
අ න් ද මන්ද වී ඇය දෙස බැලුවා ලූ
නින්ද නැතිව රැය ගණනක් ගෙවුනා ලූ
කන්ද උඩ රටට ආයෙත් ගියෙ නැහැ ලූ

අරලිය මල් මිටක් දෝතින් බදා ගෙන
කරලිය මතට වී පෝරුව අරා ගෙන
සුරලිය වගේ සුදු සලු පිළි දරා ගෙන
වනලිය කඳු රටේ හදවත සොරා ගෙන

එ දා මෙදා රහසින් වත් පව් නොකළා
ස දා පති දහම් රැක දිවි එකලු කළා
බෙදා හදා යහ ගතිගුණ පතිත කළා
වි දා නැණ නුවණ දී දරු පුබුදු කළා

ද ව ස ක් එක සැඳෑවක මහ අඳුරු කොණේ
වෙනසක් වුණා ඇගෙ දිවියේ හතර කොණේ
ක න් ද ක් කපා පැයූ සඳ මිලින වුණේ
අ හු ර ක් තරු සමග ඇගෙ ලොව පාලු වුණේ

හ රි ය ට පාන්දර හතරට දුර කතනේ
ස ව න ට වැකුණි ටියුලිප් මල පරවු සැණේ
ස ට ස ට ගගා හදගැස්මක් ජනිත වුණේ
උණනට වුණා උණු කඳුලක් දෙනෙත කොණේ

♦ ***ලිලානි පෙරේරා***
Barking -**Essex -UK**

## ඉතින් ආයුබෝවන් ලංකාවිත්ති !

ගරුසරු ආදරය හැමගෙන් ලැබ නිතර
දහසය වසක් ගෙවමින් සිට අප අතර
බෙදුමට සිතා තව සේවය දී මිහිර
යන බව ඇසිමි වෙනතක ඔබ අප අතැර

දියුණුව සමග හැමදේ වෙනසක් වෙනවා
අකමැති වුනත් එය පිළිගන්නට වෙනවා
පිය වෙන්වීම දුක සංකා ඇති වෙනවා
ඔබ යන ගමන සැක නැහැ තව සරු වෙනවා

තනිකම පාලු හැර පුරවා තුටින් සිත
කළ සෙත කියා නිම කෙරුමට වචන නැත
හද පත්ලෙන්ම සුබ ආසිරි ඔබට ඇත
ඉතින් ආයුබෝවන් රස පුවත් පත!

♦ ***කුමාරි විජේරත්න***
Hounslow Middx **UK**

## 16 වසරකට ආසිරි !

කවියන් කිවිඳියන් ලේකබයන් බෝම
බිහිකළ වසර ගණනාවක් තිස් සේම
රට රටවල වෙසෙන ලක්වැසියන් සැම
අතරේ බෙදා දුන් මුදලක් නොල බාම

ලංකාවිත්ති කළ සේවය අගේ මය
හෙළ හදවත් පුබුදු කළ හැටි අගේ මය
ලක්බිම තතු ලොවට බෙදු හැටි අගේ මය
දහසය වසක් පසුවූවා අගේ මය

දයා ආනන්ද වෙත මුල්තැන ඉන්න
වැදගත් කතුමඬුල්ලට අතහිත දුන්න
ආසිරි පතමු දින දින දියුණට යන්න
මේ බැති කුසුම් මිට සතුටින් පිළි ගන්න!

♦ ***ප්‍රේමා සුරවීර රූපසිංහ***
**නුගේගොඩ Sri Lanka**

## සොයුර්ය සරෝ !

මළ හිරු බසිනා සැන්දෑවක නොව
අරුනළු අලුයම නැගෙන උදෑසන
හෙමිහිට පැදවෙන දිලිසෙන කලු රියෙ
ගමනක යනවා ආයි නොඑන්නට

මුනිවත රකිනා මැළවුණු මුව තොල
සැරසුණි පෙර දින සොඳුරු සිනාවෙන්
නොසැලී සිටිනා සීතල පා යුග
තාලෙට නටනා රඟන විලාසෙන්

සීතල අතැඟිලි දරදඬු වී ඇත
සුරහන පටසළු නිමවුණි එ අතින
රස මුසු බොජුනන් දොරට වඩින සඳ
මුලුතැන්ගෙයි අධිපති නම් ඔබමය

මතකයෙ රැඳෙනා සිතුවිලි ඔබ ගැන
හඬගා කීවත් නොඇසෙන වග අද
වැටහුණු සඳ මට දැනුණේ හීයක්
යනවා හදවත සිදුරක් තබමින්

නිවනට යන්නට ඔබ පැතුවේ නම්
අනියත දිවි පෙළ අවසන් කරමින්
පතනෙමි සොයුරිය කෙලෙසුන් බිඳිමින්
යන්නට එතැනට නොපමව නියතින් !

*එක්සත් රාජධානියේ විශාඛා ආදි ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරී සාමාජිකාවක්ව සිටි ගිය වසරේ අභාවප්‍රාප්ත වුණු සරෝජිනී කෝදාගොඩ (දළුවත්ත) මහත්මිය සිහිවීම පිණිසය.*

♦ ***ලක්ෂමී පෙරේරා***
**Carshalton, Surrey UK**

## අරවින්ද මල නුඹය හිම්සඳ !

දෙවැට දිගේ නුඹ එන සැටි රුවට රුවේ
මෙමට දැනේ අද වාගේ හිමිසඳුනේ
පරෙවියනේ කිරිල්ලනේ අහෝ !
කොහේද හිමි සොරෙන් අරන් ගියේ ?

නෙතේ නින්ද නැත හිමි තුන්යමේ
ඉබේ කඳුළු ගංගා ඇද හැලේ
විලේ නෙළුම සරි මගෙ රන්කඳේ
වෙළේ හැම රැයේ සිහිනෙන් බඳේ

ලැබ දෙන්න දෙවිඳුනේ හිමියන් මට සොයාලා
පුත ඉන්නේ මග බලන් හිම්සද ඒ කියාලා
හිත ගින්දරෙන් මුදා තුන්සිත බිය දුරලා
ගෙන දෙන්න මහිමි ඔහු නැත වරදක් කරලා !

♦ ***ධම්මි විජේසිංහ***
**Toronto Canada**

## අළුත් අවුරුදු පැතුම් !

කිරිබත් උයන්න අවුරුද්දේ කරල් පැසීයන්
නවසඳ බලන්න අවුරුද්දේ හිත් හොඳවීයන්
හිසතෙල් ගාන්න අවුරුද්දේ ආයු ලැබීයන්
ජාතියට මගේ සාමය සහ සතුට ලැබීයන්

කිරි කවඩි සිනාවන් චක්ගුඩු නාද නැගීයන්
ඔන්චිලි චිලි වාරම් සහ ගී සින්දු ඇසීයන්
ගම්මැද්ද පුරා රබන් සුරල් හඬ පැතිරීයන්
ජාතියට මගේ සාමය සහ සතුට ලැබීයන්

කල් වැසි වැහැලා ඇල දොළ නිල්දියෙන් පිරීයන්
තුන් සරණේ සරණයි හැම දෙවි පිහිට ලැබීයන්
දුක් ගිනි නිවිලා රටතොට සව්සිරින් පිරීයන්
ජාතියට මගේ සාමය සහ සතුට ලැබීයන්

♦ ***පූජ්‍ය කෝන්වැවේ අරියරතන හිමි***
**London Buddhist Viharaya**

## මට හිතෙයි.....!

පිනි වැටෙන හිමිදිරියේ උදා අළුයම් හෝරාවේ
දැයේ මෙහෙවරට යනෙන ඔබෙ හදවතට
අළුත් පැතුමක්ව පිවිසෙන්න මට හිතෙයි.....

ඔබේ වීරිය නැණ නුවණ ලැබ
මිනිස් සවියෙන් ගොඩනැගෙන වැව් පොකුණු ළඟ
දහදියෙන් තෙත්ව ගිය ඔබෙ දෙකොපුලෙහි
සිහිල් සුළඟක්ව දැවටෙන්න මට හිතෙයි.....

පිළිසකර කොට නිමාවෙන අළුත් මග දිගේ
ගිනිගහන අව් රැල්ලෙ නිරතුරුව දැවෙන ඔබෙ දෙපතුළට
සිනිඳු පාවඩයක් වී වැතිරෙන්න මට හිතෙයි.....

හිරු නිවී මුළු නුවර සතපවන අඳුර මැද
විඩාපත්වූ ගතින් දිවෙන මංපෙත ළඟින්
සැඳෑ තරුවක්ව පායන්න මට හිතෙයි.....

♦ ***සන්ධ්‍යානි සේනාරත්න*** **Surrey UK**

## මේ නිර්මාණ පිටුව හා කිවි පදබැඳුම්

**මේ** පළවන්නේ ලංකාවිත්තියේ අවසාන කවි පිටුවයි. වසර **16** ක් පුරා සියයකට අධික විවිධ කිවි කිවිඳියන්ගේ කාව්‍ය රචනා දෙදහසකට අධික සංඛ්‍යාවක් මේ පිටුවේ පළවී ඇත. ඒ පිරිස අතර ප්‍රවීන ප්‍රකට අය බොහෝ වූහ. ඒ සමහර කිවියරුන් අද අප අතර නැත. ඒ නිර්මාන නැවුම් අළුත් සංකල්පනා වූ අතර ඉන් අප ද, ලංකාවිත්ති පාඨක සමූහයා ද ලද කාව්‍යාශ්වාදය ඉමහත් බව කියන්නේ ඔවුන්ට කරන උපහාරයක් ද වශයෙනි.

මෙය අවසාන නිර්මාණ පිටුව බව දැන සිටියේ නම් ඔවුන්ට කුමක් සිතෙනවා ඇද්ද? කුමක් ලියා එවනවා ඇද්ද? යන්න මම කල්පනා කරමි. "දියමෙන් ඇවිත් සුළඟ මෙන් ගියේය" කියා බයියාම් කීවේත් මෙයටම නොවේ ද?

♦ ***දයා***

## නිද්‍රාව

ගොලුවී මුව
පියවී ඇස්
ඉපදී මිය යයි
සිතුවිලි සිත තුළ

අක්‍රිය නැත්තේ
දෙසවන පමණකි
නැත වටහාගෙන
කිසිවෙකු ඒ බව

රොක්වී සැම දෙන
මා සයනය වට
දොඩන බස් ඇසේ
පැහැදිලිවම මට

නොමළද මළ ලෙස
නිසලව හිඳිනට
මට සිදුවුණු බව
කවුරුන් දනිතිද

තනිවී සිටිනෙම්
සිතින් ගතින්
වෙන් නොවුනද
වෙන් වී සැමගෙන් !

♦ ***සුනිල් පෙරේරා***
**Skegness, Lincs, UK**

## මාතෘ පාදං නමාමි !

දස මාසේ උදරේ ගන්වා
ඇස වාගේ රැක පණ රන්දා
බිළිඳෙකු සේ ලොව
දකින ලෙසින් මගෙ
මන නැණ ඇස පහදා
මිනිසෙකු ලෙස ලොව
දිනනුව ජයගෙන
හැදූ වැඩූ පෙම්බර අම්මා !

කිරට පෙරී උණු ලෙය රුඳුණේ
ඒ රන් කිරි කුස ගිනි නිව්වේ
තුරුළට ගෙන මා ලොව රජකරවූ
ඔබෙ පින් මහිමය දෝ දැනුණේ !
රූපං ජීරති මච්චානං
නාම ගොත්තං නජීරතී
මහදේ ඉපැදී ඉපැදී ඉපදෙයි
අම්මේ ඔබෙ රන්රුව නිබඳේ
සනහා මගෙ සිත බුදු සිරිතේ !!!

♦ *මාලපල්ලේ*
***කුමුදු රොහාන් අමරසිංහ***
**Edmonton, London**

## Kensington Garden's Round Pond

Away from dull, tediously
incessant roar of traffic
Interspersed by blaring
Klaxons and shrill sirens

A shimmering oasis for stately,
placid swans
Garrulous ducks restless, sly,
diving cormorants
Flocks of migrant Canada geese….
On a hot Summer's day, beneath
a cloudless navy-blue sky
I stroll around the pond……
Then high above the park I see
a shining
Steeply climbing silver arrow-head -
a fighter jet.
It's twin white vapour trails blur,
then vanish in the pellucid air
Like vignettes of memories
Or half remembered dreams

♦ **Denis Jansz - London NW8**

## සංචාරක කුරුල්ලෝ......

යුරෝපයේ සීත කාලෙ ආව නේද කුරුල්ලෝ
පියාසලා සත් සමුදුර පසුකළා ද කුරුල්ලෝ
වෙනින් රටක් සොයා නොගොස් කුමන ආපු කුරුල්ලෝ
මගෙ මව්බිම ලස්සනයිද කියාපන්කො කුරුල්ලෝ

නිසි අවසර ලබා නොගෙන ආවත් නුඹ කුරුල්ලෝ
අනික් අතට හරවල අපි යවන්නෙ නෑ කුරුල්ලෝ
අපේ රටේ ඉස්සර වගෙ වෙඩි හඬ නෑ කුරුල්ලෝ
ඉන්නව නම් දිගටම මෙහෙ උඹ ඉඳපං කුරුල්ලෝ

වෙන අය නම් මෙහෙ එනකොට කුඩු ගේනව කුරුල්ලෝ
සමහර අය බෝකරන්න ලෙඩ ගේනව කුරුල්ලෝ
හොරෙන් කාසි, දඹ රන්පොලු ඒ අතරේ කුරුල්ලෝ
මැණික් ගිලල සමහර අය හිරේ ලගිති කුරුල්ලෝ

බැංකුවලට කවදාවත් හොර නොකරන කුරුල්ලෝ
හොරබඩුවක් කිසිම දාක ගෙනාවෙ නැති කුරුල්ලෝ
හිස් අතින්ම ඇවිදින් හිස් අතින්ම යන කුරුල්ලෝ
නොදැන වැරදි වුනත් අපෙන් සමාවෙයන් කුරුල්ලෝ

පස්සෙන් එන කාක්කන්ට රැවටෙන් නැති කුරුල්ලෝ
හෝටල්වල කාමර තුළ ලගින්නෙ නැති කුරුල්ලෝ
පිබිදෙන මල් පොඩිකරලා දාන්නෙ නැති කුරුල්ලෝ
මෙරටට එන දෙපාවුන්ට වැඩිය හොඳයි කුරුල්ලෝ

රජකාලේ වස්තු දිහා ආසා නැති කුරුල්ලෝ
යනකොට කිසි හොර බඩුවක් අරන් නොයන කුරුල්ලෝ
ඒරොප්පෙට ආපු අයත් බලන්න එති කුරුල්ලෝ
එන හැටි, යනහැටි, මෙරටින් උගන්නපං කුරුල්ලෝ!

♦ ***නිමල් පෙරේරා*** **Las Vegas, Nv, USA**

## විවේකය

කිම්ද මේ ජීවිතේ අරපරෙස්සම පිරුණු
නිමේශයකුදු නොහැක නැවතී බලා හිඳිනු

ලපළු සෙවනේ වැතිර ගව බැටළු පැටව් දෙස
ලේන පැටවුන් රඟන වනරොදක තණ පළස
හිරු රැසින් දිදුල දිය තරු වැරූ රෑ අහස
ඇයගෙ නෙතගින් පිබිද මුවට වන් මදහාස

දිළිඳු මැයි ජීවිතේ අර පරෙස්සම පිරුණු
නිමේශයකුදු නොහැක නැවතී බලා හිඳිනු

*(විලියම් හෙන්රි ඩේවිස්ගේ ලෙෂර් (leisure)නම් කවිපෙළ ඇසුරෙනි)*

♦ ***වෛද්‍ය උදාර කුලරත්න***
**Nottingham, UK**